සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

**Second Term Test - Grade 9 - 2017**

නම : ............................................... නර්තනය කාලය : පැය 02 යි.

## I කොටස

g නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) නවග්‍රහයින් මුල් කොට ගෙන ගායනා කරනු ලබන ගායනා විශේෂයකි.
- (i) සිරස පාද
- (ii) ග්‍රහ පංති
- (iii) මල් යහන් කවි
- (iv) කළ ගෙඩි කවි

(2) අටවන ගොඩ සරඹයේ සරඹ නාමය වනුයේ,
- (i) සිව් අඩිය
- (ii) ඇල සරඹය
- (iii) අංගහාර සරඹය
- (iv) අර්ධ චක්‍ර සරඹය

(3) ''තත්ත තරි - තරි - තතරි තරි තරි'' මෙය
- (i) දවුල් පදයකි
- (ii) කසතිරම් පදයකි.
- (iii) අඩව්වකි.
- (iv) බෙර පදයකි.

(4) දෝං ජිං ජිං තකට දොංතක'' මෙම බෙර පදයේ තාල රූපය වනුයේ,
- (i) 2 + 4
- (ii) 3 + 4
- (iii) 2 + 3
- (iv) 4 + 3

(5) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පූර්ව චාරිත්‍රයකි.
- (i) ගිණි පෑගීම.
- (ii) කප් සිටුවීම.
- (iii) මඩු පේ කිරීම.
- (iv) තොටමෙට යාම

(6) කේ.එස්. ප්‍රනාන්දු ගුරුතුමා දක්ෂ ......................... නර්තන ශිල්පියෙකි.
- (i) උඩරට
- (ii) සබරගමු
- (iii) පහත රට
- (iv) ද්‍රවිඩ

(7) අලුයම් ධූරය යනු........
- (i) පෙරහැරේ වාදන අංගයකි.
- (ii) ශාන්ති කර්ම වාදන අවස්ථාවකි.
- (iii) ආගමික වාදන අවස්ථාවකි.
- (iv) අවමංගල වාදන අවස්ථාවකි.

(8) ශ්‍රී ලංකාවේ ජන ජීවිතය හා බැදි වෘත්තීන් සම්බන්ධව නිර්මාණය වී ඇති ගැමි නැටුම් වශයෙන් සැලකිය හැක්කේ,
- (i) චාමර, ගොයම් හා වේවැල්
- (ii) චාමර, පන් හා කුළු
- (iii) ගොයම්, කුළු හා මෝල් ගස්
- (iv) ලී කෙළි, කළ හා මෝල් ගස්

(9) ආගමික හා සමාජීය කටයුතු සඳහා භාවිතා වන වාදන විශේෂයක් වන්නේ,
- (i) රබන් හා අණබෙර වාදන
- (ii) මගුල් බෙර හා රබන් වාදන
- (iii) හේවිසි වාදන හා මළ බෙර වාදන
- (iv) හේවිසි වාදන හා තේමා වාදන

(10) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ දී සිදු කරන පූර්ව චාරිතයකි
(i) මල පේ කිරීම, තොටපේ කිරීම, යක් ඇනුම (ii) කප් සිටුවීම, අස්නෙ, යක් ඇනුම
(iii) තොටපේ කිරීම, කප් සිටු වීම, හත් පද නැටීම. (iv) කප් සිටුවීම, මල පේ කිරීම, තොටපේ කිරීම.

(11) ග්‍රහ පංති කවි ගායනයේ දී භාවිත කරයි.
(i) හක් ගෙඩිය (ii) අත් මිණිය (iii) පන්තේරුව (iv) බටනලාව

(12) ද්‍රවිඩ ගැමි නැටුම් අතර මුරුගන් දෙවියන් වෙනුවෙන් නර්තනය කරනු ලබන්නේ........ නැටුම් ය.
(i) කෝලාට්ටම් (ii) කාවඩි (iii) සුලකු (iv) චෙම්බු

(13) යක් ඇනුම නර්තන අංගය දක්නට ලැබෙන්නේ,
(i) රටයකුම් ශාන්තිකර්මයේදී ය. (ii) දොවොල් මඩු ශාන්තිකර්මයේදී ය.
(iii) පහන් මඩු ශාන්තිකර්මයේදී ය. (iv) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේදී ය.

(14) සුදු පිරිවටයකින් වසා දවුල වාදනය කරන්නේ..........වාදනයේ දී ය.
(i) හේවිසි (ii) රණබෙර (iii) මළ බෙර (iv) අණබෙර

(15) ඇඳුම් පැළඳුම් වේදිකා සැරසිලි මගින් අදහස් ප්‍රකාශ කිරීම .................. අභිනයයි.
(i) ආංගික (ii) සාත්විත
(iii) ආහාර්ය (iv) වාචික

(16) කුරුණෑගල යුගයට අයත් ....................... ''ඒ වේදේහ රජුගේ විධානයෙන්'' යන පංච තූර්ය නාදය පිළිබඳ තොරතුරු සඳහන් වන්නේ
(i) ථූපවංශයේ ය. (ii) මහාවංශයේ ය.
(iii) සද්ධර්ම රත්නාවලියේ ය. (iv) උම්මංග ජාතකයේ ය.

(17) බතේ උපත සහ ග්‍රහ අපලය යන මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
(i) ආචාර්ය S. පණීභාරත විසින්ය. (ii) ආචාර්ය චිත්‍රසේන විසින්ය.
(iii) කේ. එස්. ප්‍රනාන්දු විසින්ය. (iv) පිටිගල ජයසේන විසින්ය.

(18) නර්තනයේ සහ සංගීතයේ ප්‍රධාන මාධ්‍ය වන්නේ,
(i) චලනය හා තාලය (ii) නාදය හා ලය
(iii) චලනය හා නාදය (iv) චලනය හා ග්‍රහ

(19) දෙවන පරාක්‍රමබාහු රජුගේ ශෘංගාර මණ්ඩපය පිළිබඳ සඳහන් වන්නේ,
(i) කඳවුරු සිරිත කෘතියේ ය. (ii) සද්ධර්ම රත්නාවලිය කෘතියේ ය.
(iii) දළඳා සිරිත කෘතියේ ය. (iv) දඹදෙණි අස්නය කෘතියේ ය.

(20) ශන්තිකර්ම පවත්වනු ලබන්නේ දෙවියන් .................... සහ .......................... වෙනුවෙනි.
(i) මිනිසුන් - යකුන් (ii) යකුන් - ග්‍රහයන්
(iii) රෝගීන් - යකුන් (iv) ග්‍රහයන් - ආතුරයෝ

මුළු ලකුණු (2 x 20 = 40)

# II කොටස

g පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

(01) ඔබ පන්ති කාමරයේ සිදු කළ ශාන්ති කර්ම පිළිබඳ ක්ෂේත්‍ර පොත සැකසීම සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම යටතේ පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී ගුරුතුමිය ලබා දුන් උපදෙස් 02ක් ලියන්න. (ලකුණු 2)

(ii) ඔබ විසින් තෝරා ගත් ශාන්ති කර්මය පැවැත්වීමට හේතු 02ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) එම ශාන්ති කර්මයේ කතා පුවත ලියා දක්වන්න. (ලකුණු 4)

(02) ප්‍රේක්ෂක රස වින්දනය සඳහා අභිනය ඉතා වැදගත් වේ.

(i) අභිනය කොටස් නම් කරන්න. (ලකුණු 2)

(ii) ඉන් ඔබ කැමති කොටස් දෙකක් හඳුන්වන්න. (ලකුණු 4)

(iii) පාසලේ විවිධ ප්‍රසංගයේ ඔබ සිත් ගත් අංගයක් තුළ අභිනය යොදාගෙන තිබූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 4)

(03) පහත සඳහන් මාතෘකා අතරින් 02ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) සංගීතය හා නර්තනය අතර සහ සම්බන්ධතාවය

(ii) කෝලාට්ටම්

(iii) දිශා හා තල

(iv) ප්‍රවීන නර්තන ශිල්පියෙක් (5 x 2 = ලකුණු 10)

(04) (i) දඹදෙණි යුගයේ නර්තන කලාව පිළිබඳ තොරතුරු ලබා ගත හැකි සාහිත්‍ය කෘති 2ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) දේශීය නර්තන කලාවට භාරතීය ආභාෂය ලැබූ බවට එක් සාධකයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 3)

(iii) එකල භාවිතා වී ඇති වාද්‍ය භාණ්ඩ 05ක් නම් කරන්න. (ලකුණු 5)

(05) (i) අතීතයේ සන්නිවේදනය කාර්ය සඳහා භාවිතා කළ වාදන අවස්ථා 02ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) සමාජීය උත්සව සඳහා තූර්ය භාණ්ඩ යොදා ගන්නා අවස්ථා 03ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(iii) තේවා කටයුතුවලට භාවිතා කරන වාද්‍ය භාණ්ඩ 08ක් නම් කරන්න. (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

# Second Term Test - Grade 9 - 2017

## නර්තනය

## ප්‍රායෝගික පරීක්ෂණය

(1) කැමති ගායනයක් කරන්න. ලකුණු 05

(2) නම් කරන ලද ජන ගායනයක් ලකුණු 05

(3) 6, 7, 8, ගොඩ සරඹ වලින් ඔබ කැමති ගොඩ සරඹයක් ත්‍රිවිධ ලයට නර්තනය කිරීම ලකුණු 10

(4) නෛයඩි වන්නම කවිපදය ගයමින් මාත්‍රා දෙකක් සහ කස්තිරම ලකුණු 15

(5) නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපණය (කැමති චරිතයක් කරන්න) ලකුණු 15

මුළු ලකුණු 50

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

**Second Term Test - Grade 9 - 2017**

## නර්තනය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| (1) - (ii) | (6) - (iii) | (11) - (ii) | (16) - (iv) |
| (2) - (iv) | (7) - (iii) | (12) - (ii) | (17) - (i) |
| (3) - (iii) | (8) - (iii) | (13) - (iv) | (18) - (iii) |
| (4) - (ii) | (9) - (iii) | (14) - (iii) | (19) - (i) |
| (5) - (ii) | (10) - (iv) | (15) - (iii) | (20) - (ii) |

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

(01) (i) දී ඇති පිළිතුර සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 2)
(ii) පැවැත්වීමට හේතු 02 සශ්‍රීකත්වය , විනෝදාස්වාදය වශයෙන් නම් කර ඇත්නම්. (ලකුණු 4)
(iii) ශාන්තිකර්මයේ කතා පුවත ලියා ඇත්නම් (ලකුණු 4)

(02) (i) ආංගික, වාචික, සාත්වික, ආහාර්ය ලෙස නම් කර ඇත්නම් (ලකුණු 2)
(ii) කොටස් දෙකක් හඳුන්වා ඇත්නම් (ලකුණු 4)
(iii) ඇඳුම් පැළඳුම්, වේදිකා සැරසිලි ආලෝකය පිළිබඳව ලියා ඇත්නම් (ලකුණු 4)

(03) (i) කෙටි සටහන් 5 x 2 (ලකුණු 10)

(04) (i) සාහිත්‍ය කෘති - සද්ධර්මරත්නාවලිය
- දඹදෙණි අස්නය
- කදවුරු සිරිත (ලකුණු 2)
(ii) නිවැරදි පිළිතුරු ලබා දී ඇත්නම් (ලකුණු 3)
(iii) වාද්‍ය භාණ්ඩ නම් කිරීම (ලකුණු 5)

(05) (i) වාදන අවස්ථා - රණ බෙර, වද බෙර ආදී (ලකුණු 2)
(ii) ලබා දී ඇති නිවැරදි පිළිතුර (ලකුණු 3)
(iii) තේවා කටයුතු සඳහා (දවුල, තම්මැට්ටම, හොරණෑව) ආදී (ලකුණු 5)

ගණිතය පිළිතුරු පත්‍රය

**Second Term Test - Grade 7 - 2017**

දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017

**Provincial Department of Education - NWP**

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

ගණිතය පිළිතුරු පත්‍රය

**Second Term Test - Grade 6 - 2017**

දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017

**Provincial Department of Education - NWP**

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

(ලකුණු 4)

(x)

(vii)

(ලකුණු 1 x 20 = 20)

(මුළු ලකුණු 11)

(ලකුණු 2)

(ලකුණු 1 x 20 = 20)